කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

නීති පීඨය

නීතිවේදී උපාධි පරීක්ෂණය, තෙවන වසර, 2022

ව්‍යාපාර නීතිය

(පැ තුනයි)

මුළු ප්‍රශ්න සංඛ්‍යාව: 06

ප්‍රශ්න තුනකට පමණක් පිළිතුරු සපයන්න.

(අපැහැදිලි අත් අකුරු සඳහා ලකුණු අඩු කෙරේ)

---

1. අදාළ ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන සහ නඩු නීතිය උපුටා දක්වමින් පහත අවස්ථාවන්හි පැන නැඟෙන නෛතික ගැටළු සාකච්ඡා කරන්න.

(අ) ප්‍රසිද්ධ පුරාවස්තු වෙළෙන්දෙකු වන කුමාර්, සුවිශේෂිත (Unique) පෞරාණික භාණ්ඩ මිලදී ගැනීමට සොයමින් Sombra Antique වෙත යයි. සාප්පු සේවකයා පුරාණ හින්දු සංස්කෘතියට අයත් සුවිශේෂිත ලාම්පුවක් ඔහුට පෙන්වූ අතර එය Tiffin Lamp නම් වූ දකුණු ඉන්දියාවෙන් ආනයනය කරන ලද රු. 200,000/- වඩා වටිනාකම ඉක්ම වූ එකකි. වීදුරු කණ්නාඩි කැබිනෙට්ටුවක් තුළ ඇති ලාම්පුව එහි පිටුපසින් පරීක්ෂා කිරීමෙන් අනතුරුව, කුමාර් ඔක්තෝබර් 15 වන දින එය රු. 150,000/- ට මිලදී ගැනීමට එකඟ වී ඉන් අඩක් වන රු. 75,000/-ක් ගෙවූ අතර ඉතිරිය ඔහුගේ නිත්‍ය ගනුදෙනුකරුවෙකු වෙත නැවත විකිණීමෙන් අනතුරුව ඔක්තෝබර් 20 වන දින ගෙවීමට එකඟ විය. ඔක්තෝබර් 18 වන දින ඔහු ලාම්පුව රු. 250,000/- කට විකුණුවේය. එම පහන පිරිසිදු කිරීමේදී වීදුරුවේ ආලේපකර තිබූ වර්ණකයක් ගැලවී යාම නිසා එය නියම Tiffin Lamp එකක් නොවන බවත් එහි වටිනාකම රු. 25,000/- කට වඩා අඩු බවත් අනාවරණය වූ බැවින් එම පහන දින දෙකකට පසුව ආපසු ගෙනැවිත් බාර දුනි. එම පහන ප්‍රතිනිර්මාණය කර ඇති බවත් ඒවා ඉන්දියානු වෙළඳපොළ තුළ අඩු මිලට බහුලව මිලදී ගත හැකි බවත්, දින කිහිපයකට පසුව දේශීය වෙළෙන්දෙකු වෙතින් කුමාර් දැන ගත්තේය. කුමාර්, Sombra Antique

වෙතින් මුදල් ආපසු ඉල්ලා සිටි විට, රිසිට් පතේ සඳහන් පරිදි භාණ්ඩයට වෙනසක් නොකර සහ මිලදී ගත් දින සිට දින තුනක් ඇතුළත එය නැවත ලබා නොදුන්නේ නම්, ආපසු ගෙවීම් සිදු කිරීම වෙළඳසැලේ ප්‍රතිපත්තිය නොවන බව ඔහු වෙත දන්වන ලදී. එබැවින් Sombra Antique ඉතිරි මුදල ඉල්ලා සිටී.

(ලකුණු 50යි)

**(ආ)** රේඛා, එක් බෑගයක 50kg බැගින් වූ සුදු සීනි 1000kg ක් මිලදී ගැනීමට සුනීතා සමඟ ගිවිසුමක් අත්සන් කළාය. සරා සුපර් ගබඩාවේ දැනට ගබඩා කර ඇති බෑග් 200න් 20ක ප්‍රමාණයක් රේඛා හට විකිණීමට සුනීතා එකඟ විය. මිලදී ගැනීමට අදාළව චෙක්පතක් ලැබුණු පසු සුනීතා, රේඛා වෙත රිසිට්පත සහ ලිඛිත බෙදාහැරීමේ අධිකාරිය ලබා දුන්නාය. රේඛා, සති දෙකකට පසුව, රිසිට්පත සහ ලියවිල්ල සමඟ සුදු සීනි ලබා ගැනීමට ගිය විට ගබඩා බාරකරු අහඹු ලෙස බෑග් තෝරා ගත්තේය. ඉන් සමහරක් හානියට පත්ව තිබූ අතර බෙදාහැරීමට නුසුදුසු විය. පිරිසිදු බෑග් 50ක් සඳහා ඇය කළ ඉල්ලීම, ගබඩාව ප්‍රතික්ෂේප කළේ ඒවා ඇය වෙනුවෙන් වෙන් කර ඇති බව පවසමිනි. හානියට පත් මලු 10ක් සහිත මලු 50ක් ඇය වෙත භාරදීමට කටයුතු කළ අතර ඇය එය පිළිගැනීම ප්‍රතික්ෂේප කළාය. භාණ්ඩ නිසි ලෙස භාර නොදීමත් සහ හානි සඳහා අලාභත් සේම විදේශ ගැනුම්කරුවෙකු සමඟ ඇයගේ ගිවිසුම කඩ වීමට ආසන්න බැවින් ඒ සඳහා විශේෂ අලාභයකුත් ඉල්ලමින් සුනීතාට එරෙහිව නඩුකරයක් ගෙන ඒමට රේඛා දැන් අදහස් කරයි. අනෙක් අතට, භාණ්ඩ බාර නොගැනීම සම්බන්ධයෙන් රේඛාට එරෙහිව නඩු පැවරීමට සුනීතා අදහස් කරයි.

(ලකුණු 50 යි)

**2.** (අ) සහ (ආ) යන කොටස් දෙකටම පිළිතුරු සපයන්න.

**(අ)** Mavric, CIF කොන්දේසි මත බාර්ලි ටොන් 3,000ක් තිළිණ වෙත විකුණුවේය. 2022 අප්‍රේල් සිට අගෝස්තු දක්වා කාලය තුළ The Evening Light නම් නෞකාවෙන් හැම්බර්ග් සිට ලන්ඩන් හරහා කොළඹට භාණ්ඩ නැව්ගත කරන බව ගිවිසුමේ සඳහන් විය. කෙසේ වෙතත්, බාර්ලි පැටවීම අවසන් වූයේ 2022 සැප්තැම්බර් 2 වන දිනය. Mavric, ඉන්වොයිසිය, නෞභාර පත්‍රය, රක්ෂණ සහතිකය සහ ලිඛිත ප්‍රකාශයක් තිළිණ වෙත යැවීය. ලේඛන ලැබීමෙන් අනතුරුව, නෞභාර පත්‍රය 2022 අගෝස්තු 02 ලෙස වැරදියට සටහන් කර ඇති බවත්, රක්ෂණ ඔප්පුවට අනුව බාර්ලි, සාමාන්‍ය සාගර අවදානම්වලට එරෙහිව රක්ෂණය කර ඇති නමුත් යුධ

අවදානම් වලට එරෙහිව රක්ෂණය කර නොමැති බවත් තිලිණට වැටහී ගියේය. හැම්බර්ග් සිට ලන්ඩන් දක්වා මුහුදු ගමන පමණක් රක්ෂණ ඔප්පුව මඟින් ආවරණය වන නමුත් ලන්ඩනයේ සිට කොළඹ දක්වා වූ මුහුදු ගමන සඳහා ඔහු සන්තකයේ වූ රක්ෂණ ඔප්පුවෙහි නියම අදාළ වන බව දක්වන අතිරේඛ ලිඛිත ප්‍රකාශයක් පවතින බව ඔහු සොයා ගත්තේය.

නැව්ගත කිරීමට අදාළ ලියවිලි භාරගත යුතුද යන්න පිළිබඳව තිලිණ වෙත උපදෙස් දෙන්න.

(ලකුණු 50යි)

**(ආ)** බ්‍රිස්ටල්හි සිටින Barrey, නුවර සිටින Marten වෙත FOB නියම යටතේ blueberries ටොන් 4000ක් විකුණයි. නැව්ගත කිරීම 2022 අගෝස්තු මස සිදු විය යුතු බව ගිවිසුමේ සඳහන් විය. අගෝස්තු 17 වන දින Marten, "starwings" නම් කල අතර එය අගෝස්තු 24 වන විට පැටවීම සඳහා සූදානම් විය. කෙසේ වෙතත්, අගෝස්තු 20 වන දින, Starwings නම් කිරීම ඉල්ලා අස් කර ගත් බව දන්වමින් Marten වෙතින් Barrey වෙත ෆැක්ස් පණිවිඩයක් ලැබුණි. දින හතරකට පසු, ආදේශක නෞකාවක් ලෙස Marten, "Chronicle" නම් නෞකාව නම් කල අතර එය අගෝස්තු 28 වන විට පැටවීමට සූදානම් වනු ඇතැයි අපේක්ෂා කරන ලදී. Marten ගේ උපදෙස් පරිදි අගෝස්තු 28 වන දින blueberries තොගය තටාකාංගනය වෙත රැගෙන ඒමට Barrey කටයුතු කළේය. කෙසේ වෙතත්, අගෝස්තු 31 වනදා සවස 3.00 වන තෙක් "Chronicle" භාණ්ඩ පැටවීම සඳහා සූදානම් තත්ත්වයේ නොවීය. අගෝස්තු 28 සිට අගෝස්තු 31 දක්වා කාලය තුළ තෙතමනයට නිරාවරණය වීම නිසා blueberries නරක වී ඇත. අගෝස්තු 31 වන දින ව්‍යාපාරික කටයුතු අවසන් වීමට පෙර භාණ්ඩ පැටවීමට ප්‍රමාණවත් කාලයක් Barrey වෙත නොතිබුණි.

ඉහත සංසිද්ධියෙන් පැන නැගෙන නෛතික ගැටළු සහ අදාළ පාර්ශ්වයන්ගේ අයිතිවාසිකම් හා වගකීම් සාකච්ඡා කරන්න.

(ලකුණු 50යි)

3. "සාමාන්‍යයෙන් ප්‍රවේශම් සහගත සහ දූරදර්ශී යාත්‍රා හිමිකරුවෙකු, තම යාත්‍රාවේ ගමන ආරම්භයේදීම එහි ඇතිවිය හැකි සියළු තත්ත්වයන් පිළිබඳව සැලකිල්ලට ගත යුතු අතර යාත්‍රාව සතුව එම යෝග්‍යතාව පැවතිය යුතුය.... "

Channell J. in *Mcfadden* v. *Blue Star Line* (1905) 1 KB 697

මුහුදින් භාණ්ඩ ප්‍රවාහනය කිරීමේ ගිවිසුමක ප්‍රවාහකගේ බැඳීම යටතේ නිසි අවධානයේ පරීක්ෂණය ක්‍රියාත්මක කිරීම සඳහා පවතින ප්‍රමිතීන් කෙරෙහි අවධානය යොමු කරමින් උක්ත ප්‍රකාශයේ වලංගුතාව විවේචනාත්මකව විශ්ලේෂණය කරන්න.
ඔබේ පිළිතුර අදාළ දේශීය හා ජාත්‍යන්තර නීති මෙවලම් සහ බලධාරී තීන්දු ඇසුරෙන් තහවුරු කරන්න.

(ලකුණු 100යි)

4. අදාළ ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන, විනිශ්චිත තීන්දු සහ හේතු ගෙනහැර දක්වමින් පහත ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

**(අ)** සේනව පොළඹවා රොහාන්, ඔහුගේ වාසිය පිණිස ලියන ලද චෙක්පතක් ලබා ගනියි. පසුව ඔහු නලින් වෙතින් පරිගණකයක් මිලදී ගෙන චෙක්පත නලින් වෙත පිටසන් කරයි. නලින් පසුව වටිනාකමක් සඳහා චෙක්පත රොහාන් වෙත පිටසන් කරයි. කල්පිරෙන අවස්ථාවේ චෙක්පත අගරු වේ. රොහාන් මුදල් අය කර ගැනීම සඳහා සේනට එරෙහිව නඩු පවරයි. රොහාන් නඩුවෙන් සාර්ථක වන්නේයැයි ඔබ සිතන්නේද?

(ලකුණු 25යි)

**(ආ)** සමන් සිය බැංකුව වන ට්‍රුස්ට් බැංකුව මත අණ කරන ලද සාමාන්‍ය ලෙස රේඛිත "ගනුදෙනු කල නොහැක" යනුවෙන් සටහන් කරන ලද චෙක්පතක් මාලා වෙත දුන්නේය. චෙක්පත නැතිවූ අතර සේන එය සොයාගෙන, සද්භාවයෙන් එය පිළිගෙන වටිනාකම ගෙවනු ලැබූ බර්නාර්ඩ් වෙත ලබා දෙයි. බර්නාර්ඩ් චෙක්පත ඔහුගේ බැංකුව වන රෝයල් බැංකුවේ තැන්පත් කරන අතර රෝයල් බැංකුව එය ට්‍රුස්ට් බැංකුව වෙත ඉදිරිපත් කර සිය ගනුදෙනුකරුවෙකු වෙනුවෙන් ගෙවීම ලබා ගනියි.

(i) මාලාගේ මුදල් ආපසු ගෙවන ලෙස බර්නාර්ඩ් හට බල කල හැකිද?

(ii) චෙක්පත මාලා වෙත ගෙවිය යුතු බවට සකස් කර "ප්‍රිමියර් බැංකුව" යන වචන සමඟ විශේෂයෙන් රේඛනය කර "ගනුදෙනු කල නොහැක" ලෙස සටහන් කර ඇත්නම් ඔබේ පිළිතුර වෙනස් වන්නේද?

(ලකුණු 25යි)

**(ඇ)** දරන්නාට ගෙවිය යුතු චෙක්පතක ධාරකයා වන පියල් වටිනාකමක් රහිතව ලාල් වෙත එය පවරයි. ලාල්ද එය වටිනාකමක් රහිතව රීටා වෙත පවරයි. රීටා එය වටිනාකමක් සහිතව නිමල් වෙත පවරයි. නිමල් එය වටිනාකමක් රහිතව එමා වෙත පවරයි. එමා ගෙවීම ලබා ගැනීම සඳහා චෙක්පත ඉදිරිපත් කල විට එය අහරු විය. එමා හට චෙක්පතෙහි වටිනාකම චෙක්පතට සම්බන්ධ ඕනෑම පූර්ව පාර්ශ්වයක් වෙතින් ලබා ගත හැකිද යන්න සාකච්ඡා කරන්න.

ඉහත තත්ත්වය තුළ චෙක්පත අණට ගෙවිය යුතු චෙක්පතක් නම් ඔබේ පිළිතුර වෙනස් වන්නේද?

(ලකුණු 50යි)

**5.** ලීසා නුවරඑළියෙහි සිටින නැවුම් රෝස මල් අලෙවි කරන ව්‍යාපාරික කාන්තාවකි. ඇය දිවයින පුරා මල් අලෙවි කරන අතර සෑම දිස්ත්‍රික්කයකම පාරිභෝගිකයින් සිටී. කොළඹදී සිදුවන සිය දියණියගේ විවාහ මංගල්‍යයය සඳහා රෝස මල් 1000ක් මිලදී ගැනීමට ලිලී අදහස් කළාය. ලීසාගේ කොළඹ පිහිටි වෙළඳසැල වෙත ගිය ලිලී, ලීසා සමඟ වසර 10ක් සේවය කළ ලීසාගේ කළමනාකාරවරිය වූ මීසා හමු වී ඇණවුම භාර දුන්නාය. සති දෙකකින් මල් භාර දීමට මීසා එකඟ විය. මීසා, ලිලී හට දන්වා සිටියේ ඒවා ඇගේ වත්තේ නැවුම් රෝස මල් බවයි. ගනුදෙනුව අවසන් කිරීම සඳහා ලිලී වහාම රු. 100,000/-ක මුදල් අත්තිකාරමක් ගෙව්වාය. අත්තිකාරම් සඳහා රිසිට්පතක් ලබාදීමට මීසාට අමතක විය. ඊට අමතරව, නැවුම් මල් රැගෙන එන ලෙස නැවත පවසමින් ලිලී, මීසා වෙත රු. 10,000/-ක් ගෙව්වාය. ඇණවුම සහ රු. 100,000/- මුදල් අත්තිකාරම පිළිබඳව පමණක් මීසා, ලීසා වෙත ප්‍රකාශ කළාය. ලීසා, නියමිත දිනට පෙර දින මහනුවර දුම්රිය ස්ථානය වෙත මල්තොගය භාර දුන්නාය. රට තුළ පැවති හදිසි තත්ත්වය සහ ඇඳිරි නීතිය හේතුවෙන් සියලුම දුම්රිය ගමන්වාර

අවලංගු වූ අතර ගමනාගමන කටයුතු සියල්ල අඩාල විය. දුම්රිය ස්ථානාධිපතිවරයා, පාඩුව අවම කර ගැනීමේ අරමුණින්, ප්‍රවාහනය සඳහා ඔහු වෙත භාර දුන් ඉක්මනින් නරක්වන ස්වභාවයේ භාණ්ඩ විකුණා දැමීය. ඔහු රෝස මල් සම්බන්ධයෙන්ද එසේ කළේය. තමාට අහිමිවූ මුදල් සහ වගකීම් විරහිත හැසිරීම් සම්බන්ධයෙන් මීසාට සහ දුම්රිය ස්ථානාධිපතිවරයාට එරෙහිව නඩු පැවරීමට ලිලී දැන් අදහස් කරයි.

ඉහත සිද්ධියට සම්බන්ධ සියලුම පාර්ශ්වයන්ගේ අයිතිවාසිකම්, යුතුකම් සහ වගකීම් වලට අදාළ නෛතික සංකල්ප සාකච්ඡා කරන්න.

(ලකුණු 100යි )

6. ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන සහ නඩු නීතිය ඇසුරෙන් **(අ)** හෝ **(ආ)** යන කොටස් දෙකින් **<u>එක් කොටසකට පමණක්</u>** හේතු දක්වමින් පිළිතුරු සපයන්න.

<u>එක්කෝ</u>

**(අ)** ශ්‍රී ලංකාවේ භාණ්ඩ විකිණීමේ ආඥාපනත, මිල නොලත් විකුණුම්කරුවන් වෙත පවතින අයිතිවාසිකම් පිළිගනී; කෙසේ වෙතත්, ඒවා අවධානම මාරු වීම පිළිබඳ රීති සහ ගිවිසුම් නියම සමඟ ඒකාබද්ධව කියවිය යුතුය.

(ලකුණු 100යි)

<u>නැතහොත්</u>

**(ආ)** අන්තර්ජාතික භාණ්ඩ විකිණීමේ එක්සත් ජාතීන්ගේ සම්මුතියේ (CISG) මූලික කර්තව්‍ය වන්නේ අන්තර්ජාතික භාණ්ඩ විකිණීමේ ගිවිසුම් වෙත එළඹීම සහ බලාත්මක කිරීමට ඇති නීතිමය බාධා ඉවත් කරමින් අන්තර්ජාතික වෙළඳාමේ එකගතාවන් ප්‍රවර්ධනය කිරීමයි.

(ලකුණු 100යි)

****************************************